# ගම්පහ ප්‍රාදේශීය සභාව

## ලංසු ආරාධනයයි

### මෝටර් වාහන, යන්ත්‍ර සූත්‍ර හා ත්‍රීරෝද රථ පූර්ණ රක්ෂණය සිදු කිරීම

### ප්‍රසම්පාදන අංකය - DS/05/2025

01. ගම්පහ ප්‍රාදේශීය සභාව සතු මෝටර් වාහන, යන්ත්‍ර සූත්‍ර හා ත්‍රිරෝද රථ සඳහා 2025.11.27 දින සිට 2026.11.26 දින දක්වා වසරක කාලයකට පහත සඳහන් ආවරණ සහිතව පූර්ණ රක්ෂණය සිදුකිරීම සඳහා මුද්‍රා තබන ලද ලංසු , මවිසින් කැඳවනු ලැබේ.

<u>ලබාගත යුතු රක්ෂණ ආවරණ</u>

I. කැරලි - කෝලහල ආවරණය
II. හදිසි අනතුරු
III. ගිනි රක්ෂණ ආවරණය
IV. ස්වාභාවික විපත්
V. සොරකිය
VI. තෙවන පාර්ශ්ව ආවරණය අවම වශයෙන් රුපියල් ලක්ෂ 02ක් විය යුතුය.
VII. පෞද්ගලික රක්ෂණ වන්දි ආවරණය රථයේ ගමන් කරන එක් පුද්ගලයෙකුට අවම වශයෙන් රුපියල් 50,000.00 ක් විය යුතුය.
VIII. කම්කරු රක්ෂණ වන්දි ආවරණය (රියදුරු සඳහා)
IX. ත්‍රස්ත විපත් ආවරණය

02. ලංසු කැඳවනු ලබනුයේ ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුවය.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසු කරුවන් හට **2025.09.15** දින සිට රජයේ කාර්යාල දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව.2.00 දක්වා කාලය තුළ ගම්පහ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය වෙත පැමිණ ලංසුපත් පරීක්ෂා කර බැලිය හැකි අතර මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කාර්යාලයීය වේලාව තුළ වැඩ අධිකාරී (033-2220145) වෙතින් ලබාගත හැකිය.

04. **2025.09.15 දින සිට 2025.10.07 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.2.00ක්වා** කාලය තුළ ආපසු නොගෙවන **රු.1000.00 +වැට්** ගාස්තුවක් මුදලින් ගෙවා ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සංවර්ධන අංශයෙන් ලංසු ලේඛන ලබාගත හැකිය.

05. ලංසු සුරක්ෂණය ලෙස **රු.5,000.00 (රුපියල් පන්දහසක) ක** මුදලක් ගම්පහ ප්‍රාදේශීය සභාවේ තැන්පත් කර, එම ලදුපත මුද්‍රා තබන ලද ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

06. ලංසු, මුල් පිටපත හා අනුපිටපත් ලෙස පිළියෙල කර **2025.10.08** වන දින **පෙ.ව.11.00** ට හෝ ඉන් පෙර ලැබෙන සේ **"සභාපති , ගම්පහ ප්‍රාදේශීය සභාව, මීරිස්වත්ත, මුදුන්ගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගම්පහ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ, ලේකම් නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ප්‍රසම්පාදන අංකය, ප්‍රසම්පාදනයේ නම හා මුල් පිටපත හෝ අනුපිටපත යනුවෙන් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන මිල ගණන් ඇස්තමේන්තු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ලංසු භාර ගන්නා වේලාව ඉක්ම වූ වහාම පැමිණ සිටින ලංසුකරුවන් / නියෝජිතයින් ඉදිරියේ දී ගම්පහ ප්‍රාදේශීය සභා කුඩා ශ්‍රවණාගාරයේ දී ලංසු විවෘත කරනු ලැබේ.

07. මෙම ලංසු පිළිගැනීම හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ හෝ බලය ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

**බී.ඩී.සෙනරත් පීරිස්**
**සභාපති**
**ගම්පහ ප්‍රාදේශීය සභාව,**
**මීරිස්වත්ත, මුදුන්ගොඩ.**

**2025.09.12**

**දු.අංකය : 033 2220145**
**ෆැක්ස් : 033 2220144**
**විද්‍යුත් ලිපිනය : gampahapradeshiyasabha@gmail.com**